# දරුවන් උදෙසා බයිබලයක්

## අවුරුදු හතළිහක්



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Lyn Doerksen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල්වරුන්
ඊජිප්තු දේශයෙන් ගළවා ගත්විට
මෝසෙස් ඔවුන්ව දේව නමස්කාරයට
යොමු කළේය. ඔහු ප්‍රශංසා ගීතයක්
තැනුවේය. “මම සමිඳාණන් වහන්සේට
ගී කියන්නෙමි. මන්ද උන්වහන්සේ
තේජාන්විත ලෙස ජයගත් සේක”
ඊශ්‍රායෙල් දේශයට දෙවියන් වහන්සේ
කළ මහත් දේ ගැන මෝසෙස් ගී
ගැයුවේය.

හාලේලූයා!
දෙවියන් වහන්සේට
මහිමය වේවා!




දින තුනකට පසු කාන්තාරයේදී
වතුර පිපාසයෙන් සිටි මිනිසුන්ට දිය
උල්පතක් හමුවිය. නමුත් එහි වතුර
තික්ත වූ නිසා ඔවුන්ට බීමට නොහැකි
විය. ඔවුහු යාච්ඤා කරනු වෙනුවට
චෝදනා නඟන්නට වූවෝය. දෙවියන්
වහන්සේ කරුණාවන්ත වූ සේක.
උන් වහන්සේ ඒ
වතුර බීමට සුදුසු ලෙස
පිරිසිදු කළ සේක.



මිනිසුන් සෑම දේටම මැසිවිලි නඟන බව පෙනුණි. “අපිට ඊජිප්තු රටේ කන්නට කෑම තිබුණි. මේ කාන්තාරයේ අපි කුසගින්නෙන් මිය යනු ඇතැ” යි ඔවුහු විලාප නැඟූහ. එදා සවස් කාලයේදී දෙවියන් වහන්සේ වටු කුරුල්ලන් එවූ සේක. මිනිස්සු උන් පහසුවෙන් අල්ලා ගත්තෝය.

පසුදා උදයේ දෙවියන් වහන්සේ මන්නා එවූ සේක. ඒවා පැණිරස වූ පාන් වැනි දෙයකි. සෑම උදයකම එකතු කරනු පිණිස පොළොවේ මන්නා වැටී තිබුණේය. මේ ආකාරයට දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ජනතාව කාන්තාරයේදී පෝෂණය කළ සේක.



ඔවුහු, දෙවියන් වහන්සේ ඔවුන්ට සෑම දිනකම නැවුම් ආහාර ලබාදෙන බව විශ්වාස කළෝය. වැඩිපුර එකතු කරගෙන තියාගන්නා මන්නා රාත්‍රි කාලයේදී නරක් වන බව දෙවියන් වහන්සේ කියා තිබුනු නමුත් සමහර අය මන්නා වැඩිපුර එකතු කරගත්තෝය.



උන්වහන්සේ කී ලෙසම පෙරදින මන්නා පණුවන්ගෙන් පිරී නරක් වී තිබුනි. නමුත් සබත් දිනයේදි එසේ සිදු නොවීය. ඒ විශේෂ හත්වන දවසේදී මිනිස්සු  විවේක ගෙන පෙරදින එකතු කරගත් මන්නා කෑවෝය.



දෙවියන්
වහන්සේ
ඊශ්‍රායෙල්වරුන්ව
කාන්තාරයේදී
රැකබලා ගත් සේක.
උන්වහන්සේ ඔවුන්ට
ආහාර හා වතුර දුන්සේක.
සතුරන්ගෙන් ඔවුන් ආරක්ෂා
කළ සේක.

අමලෙක්වරුන් පහර දෙන්නට
පැමිණි මොහොතේ මෝසෙස්
දෙවියන් වහන්සේගේ යෂ්ඨිය
ඔසවා සිටින අතරතුරදී
ඊශ්‍රායෙල්වරු
යුද්ධය දිනූහ.





“ඔබ මාගේ හඬට කීකරු වුවහොත් ඔබ මාගේ විශේෂ
ජනතාව බවට පත්වන්නේයැ” යි දෙවියන් වහන්සේ
ඊශ්‍රායෙල්වරුන්ට කීසේක. “දෙවියන් වහන්සේ කියන හැම
දෙයක්ම අපි කරන්නෙමු” යැයි මිනිස්සු මෝසෙස්ට කීවෝය.
ඔවුහු සීනායි කන්ද පාමුලට ඇවිත් නැවතුනෝය.
මෝසෙස් දෙවියන් වහන්සේ හමුවන්නට ගියේය.



මෝසෙස්
දෙවියන්
වහන්සේ සමඟ
දවස් හතළිහක්
කන්ද මත
සිටියේය.
දෙවියන්
වහන්සේ ගල්
පුවරු දෙකක්
මත දස පණත
ලියූ සේක.
උන්වහන්සේ
තම ජනතාව
ජීවත් විය යුතු
ආකාරය
මෝසෙස්ට
කීසේක.

1. “මා හැර වෙනත් දෙවිවරු ඔබට නොසිටිය යුතුය.”

2. “පිළිම සාදා නොගත යුතුය. ඒවාට වැඳ නමස්කාර නොකළ යුතුය.”

3. “ස්වාමින් වහන්සේගේ නාමය නිකරුණේ භාවිතා නොකළ යුතුය.”

4. “සබත් දිනය ශුද්ධ ලෙස පැවැත්විය යුතුය.”

5. “ඔබේ පියාටත් මවටත් ගෞරව කළ යුතුය.”

6. “මිනී නොමැරිය
යුතුය.”

7. “කාමයේ වැරදි
ලෙස නොහැසිරිය
යුතුය.”

8. “සොරකම්
නොකළ යුතුය.”

9. “බොරු
නොකිය යුතුය.”

10. “අන් අයට
අයිති දේට ආශා
නොවිය යුතුය.”



මෝසෙස් දෙවියන් වහන්සේ
සමඟ සීනායි කන්ද මත
සිටිද්දී ඊශ්‍රායෙල්වරු මහා
භයානක දෙයක් කළෝය.
ඔවුහු රත්තරන් වස්සෙකු
සාදන ලෙසට ආරොන්ට
අණ කර, දෙවියන් වහන්සේ
වෙනුවට එයට නමස්කාර
කළෝය. දෙවියන් වහන්සේ
බොහෝ සේ කෝප වූ
සේක. මෝසෙස් ද එසේමය.



වස්සාගේ රූපයද, නට නටා සිටින මිනිසුන්ද දුටු මෝසෙස් ගල් පුවරු දෙක පොළොවේ ගැසුවේය. කෝපයෙන් සිටි මෝසෙස් ඒ රත්තරන් පිළිමය විනාශ කළේය. එයට නමස්කාර කළ දුෂ්ඨ මිනිස්සු මරා දමනු ලැබුවෝය.

දෙවියන් වහන්සේ විනාශ
වූ ඒවා වෙනුවට අලුත් ගල් පුවරු
දෙකක් ලබාදුන් සේක. දෙවියන්
වහන්සේ, තමන්වහන්සේට තම
සෙනඟ සමඟ වාසය කරන්නට වැටක්
සහිත විශාල කූඩාරමක් ගොඩනඟන
ලෙස මෝසෙස්ට කීසේක. එහිදී ඔවුන්
දෙවියන් වහන්සේට නමස්කාර කළ
යුතු විය. වලාකුළු ටැඹ සහ
ගිනි ටැඹ, දෙවියන්
වහන්සේ ඔවුන්
සමඟ සිටින බව
පෙන්නුම්
කළේය.



ඔවුන් කානාන් දේශයට ළඟා වූ විට, දෙවියන් වහන්සේ තම සෙනඟට පොරොන්දු වූ දේශය බැලීමට මෝසෙස් ඔත්තුකරුවන් දොළොස් දෙනෙකු යැව්වේය. ඔත්තුකරුවන් සියල්ලෝම ඒ දේශය මනහර එකක් බවට එකඟ වූවෝය. නමුත් ජෝෂුවා සහ කාලෙබ් යන දෙදෙනා පමණක් දෙවියන් වහන්සේගේ උපකාරයෙන් දේශය යටත් කර ගත හැකි යැයි විශ්වාස කළෝය.



අනෙක් ඔත්තුකරුවන් දසදෙනා
දේශයේ ශක්තිමත් නගර සහ එහි
විසූ යෝධයන් මෙන්වූ මනුෂ්‍යයන්ට
බිය වූවෝය. “අපට ඒ දේශය
ලබාගත නොහැකියැ”
යි ඔවුහු කෙඳිරි
ගෑවෝය.
ඊජිප්තුවෙන්
ඔවුන්ව නිදහස්



කර ගැනීමට
දෙවියන් වහන්සේ
කළ මහත් දේ ඔවුන්ට
අමතක විය.

මිනිස්සු, නොඇදහිලිකාර ඔත්තුකරුවන් දසදෙනා පසුපස ගියෝය. ඔවුහු හඬා වැලපෙමින් නැවත ඊජිප්තුවට යාමට සූදානම් වූවෝය. ඔවුහු මෝසෙස්ව මරන්න පවා උත්සාහ කළෝය!



දෙවියන් වහන්සේ මෝසෙස් ගේ ජීවිතය ගැළවූ සේක. ඉන්පසු උන්වහන්සේ මිනිසුන්ට කතා කරමින් “ඔබ අවුරුදු හතළිහක් පාළුකරයේ සැරිසරනු ඇත. ඔබ පිළිකුල් කළ නිසා ඒ දේශයට ඇතුළු වන්නේ කාලෙබ්, ජෝෂුවා සහ ඔබේ දරුවන් පමණි” යැයි කී සේක.



අවුරුදු හතළිහක්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

නික්මයාම 15 සිට ගණන් කතාව 14

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)